# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

**ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2016 (පැරණි නිර්දේශය)**

**2022 මාර්තු/අප්‍රේල්**

**මානවශාස්ත්‍ර පීඨය**

## සිංහල - SINH E 1015

## නාට්‍ය කලාව, නූතන සිංහල කාව්‍ය හා ප්‍රබන්ධ කථා

පළමුවන ප්‍රශ්නය ද, දෙවන හා තෙවන කොටස්වලින් ප්‍රශ්න දෙක (02) බැගින් ද, තෝරාගෙන ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 09 යි.
කාලය : පැය 03 යි.

---

### 1 කොටස

1. පහත සඳහන් පද්‍ය නිර්මාණය විචාරය කරන්න.

| | |
|---|---|
| හිමි ඔබ සයුර මැද රුදු සටනක ය | රැයේ |
| පොල් අතු පැලේ මම තනියම වෙසෙමි | බියේ |
| ඇති මුත් හුරු පුරුදු එඩිතර ගතිය | ළයේ |
| තරමක් සැකයකිනි ඔබ අද හවස | ගියේ |
| | |
| අහසේ අඳුරු පැහැ වැහි කළු නඟින | කොට |
| සුළඟේ වෙනස මෙහි ගහ කොළ කියන | කොට |
| ගෙරවිලි සහිත විදුලිය හඬ ඇසෙන | කොට |
| හිමියනි මගේ හිත වාවනු බැරි ය | මට |
| | |
| හබලට ඔබේ සවිබල අත | රිදෙනවද |
| ඔරු කඳ උඩින් දළ රළ පෙළ | නගිනවද |
| සීතල සුළඟ රළුවට ඇඟ | වැදෙනවද |
| හිමියනි වෙහෙස නිදි මත දෙක දැනෙන | වද |
| | |
| ගොඩ බිම කොහෙද නැති මහ මුහුදෙහි | ඇත |
| හිමි ඇත වෙහෙසෙමින් වෙහෙසි ඇති | දැත |
| ඔබ නැති නිසා හිමියනි මේ ළඟ | පාත |
| සුළඟේ මැකී යයි මගෙ දුක් මුසු | ගීත |
| | |
| එළියක් පෙනෙන විට හිමියනි වෙරළ | බඩ |
| නැතහොත් දැනෙන විට ඔරුවක් ඇදෙන | හඬ |
| දෙසවන වැටෙන වට කිසිවෙකු නගන | හඬ |
| නො දැනුවත් ව ම මම මගෙ දෙපය | උඩ |
| | |
| වැහි පොද මගෙ හිමිගෙ හිස මත නොවැ | ටේවා |
| මේ රුදු සුළඟින් රැළි රළ පිට නො ගැ | ටේවා |
| පැද යන ඔරුව වෙත මසු කැල දැව | ටේවා |
| ලන ඇම ගිලින තරමට උන් රැව | ටේවා |
| | |
| ඔබ එනතුරා නැත මගෙ සිත සැනසෙ | න්නේ |
| මා ගැන නොවෙද හිමි මේ හැටි වෙහෙසෙ | න්නේ |
| සවසට යාමටයි ඔබ උදයට එ | න්නේ |
| මෙහෙමද ජීවිතේ දිගට ම ගත වෙ | න්නේ |

| | |
|---|---|
| ඔබ මහ මුහුද මැද තනිව ම වෙසෙන | කල |
| සිහියට නැගෙනු ඇත මෙහි මා නිදන | පැල |
| හිමියනි ඔබට මගෙ හදවත මිහිරි | කළ |
| සැනසුම තිබෙ මේ පොල් අතු කුටිය | තුළ |

## 11 කොටස

2. කොළඹ යුගයේ වැඩිහිටි කවීන්ගේ පද්‍ය නිර්මාණයන්හි වස්තු විෂය කාලීන සමාජ අවශ්‍යතා සපුරාලීමට සමත් වූ ආකාරය නිදසුන් සහිත ව සාකච්ඡා කරන්න.

3. කොළඹ යුගයේ තරුණ කවීන්ගේ පද්‍ය නිර්මාණයන්හි මූලික ලක්ෂණ නිදර්ශනාශ්‍රයෙන් පරීක්ෂා කරන්න.

4. "නාට්‍ය කලාව වනාහී ඊට ම අනන්‍ය ලක්ෂණයන්ගෙන් සමන්විත කලාංගයකි."නිදසුන් ඇසුරෙන් පහදන්න.

5. රත්නාවලී නාට්‍යයේ උදයන රජුගේ චරිතය පිළිබඳ විමසීමක් කරන්න.

## 111 කොටස

6. කෙටිකතාව නවකතාවෙන් වෙනස් ව ඊට ම අනන්‍ය වූ ලක්ෂණයන්ගෙන් සමන්විත සාහිත්‍යාංගයක් බවට පත්වන්නේ කවර සාධක මත දැයි නිදසුන් ඇසුරෙන් සාකච්ඡා කරන්න.

7. පහත සඳහන් කෙටිකතා අතරින් එකක් පිළිබඳ ප්‍රමාණවත් විචාරයක් කරන්න.
   - (අ) මුදියන්සේ මාමා
   - (ආ) ගුරුවරයා
   - (ඇ) වතුර
   - (ඈ) කේතුමතී හෝටලයේ රාත්‍රියක්

8. "නවකතාව වනාහි පුද්ගල යථාර්ථය හා සමාජ යථාර්ථය ගැඹුරින් නිරූපණය කළ හැකි සංකීර්ණ සාහිත්‍යාංගයකි."උදාහරණ තුනක්වත් පාදක කර ගනිමින් සාකච්ඡා කරන්න.

9. තෘෂ්ණාහරණ නවකතාවේ චරිත නිරූපණය පිළිබඳ විග්‍රහයක් කරන්න.